## ගොවීන්ගේ භාරකාර අරමුදල - 2012

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට ගොවීන්ගේ භාරකාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු දිගු කාලීන ණය යටතේ දක්වා තිබුණු සමාගමකින් අයවිය යුතු රු.6,708,333 ක ණය ශේෂය වර්ෂ 05 කට වැඩි කාලයක සිට නිරවුල් නොවී පැවතුනි.

(ආ). කෙටි කාලීන ණය යටතේ දක්වා තිබූ වසර 7 ක් ඉකමවූ ණය ශේෂය රු.114,810,370 ක් වූ අතර, එම ණය ආපසු අයකර ගැනීමේ සක්‍රීය වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ). අත්තිකාරම් යටතේ දැක්වෙන රු.16,428,742 ක් වූ ශේෂ 04 ක් වර්ෂ 05 කට වැඩි කාලයක සිට නිරවුල් නොවී පැවතුනි.

(ඈ). වර්ෂ 03 ට වැඩි කාලයක සිට මූල්‍ය පකාශනවල නිරවුල් නොවී ඉදිරියට එන රු.787,408 ක් වූ බැරකම් ශේෂ 03 ක් සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 1.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත සඳහන් වත්කම් හා වගකීම් ශේෂ ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොමැතිවීම හේතුවෙන් සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

| | විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| (අ). | ජංගම වත්කම් | | |
| | ඉතිරිකිරීමේ බැංකු ගිණුම් | 7,241,656 | බැංකු ශේෂය සනාථ කිරීම සඳහා බැංකු ගිණුම් අංකය හා ඊට අදාල ලිපිලේඛන |
| (ආ). | ලැබිය යුතු කෙටිකාලීන ණය | | |
| | (i). ණයගැති පාලන ගිණුම - කෘෂිකාර්මික භාරකාර අරමුදල | 7,923,175 | ණය ශේෂ ලැයිස්තු |
| | (ii). ණයගැති පාලන ගිණුම - චක්‍රීය අරමුදල | 44,255,850 | ණය ශේෂ ලැයිස්තු |
| (ඇ). | ලැබිය යුතු දිගුකාලීන ණය | | |
| | ගොවි බැංකු ණය - ගොවිජන සේවා කමිටු ගිණුම | 9,112,579 | ණය ශේෂ ලැයිස්තු |
| (ඈ). | ජංගම නොවන වගකීම් | | |
| | ගොවීන්ගේ තැන්පතු | 697,644 | වගකීම් සනාථ කිරීම සඳහා වූ ලිපිලේඛන |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් වලින් රු.217,817,432 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.167,551,648 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.50,265,784 ක ශුද්ධ වර්ධනයක් නිරීක්ෂණය විය. ආදායම් රු.67,557,239 කින් සහ සංවර්ධන වියදම් රු.17,162,412 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

#### 3.1.1 අත්තිකාරම් පියවීමේ ප්‍රමාදයන්

සංවර්ධන කාර්යයන් සඳහා අත්තිකාරම් ලබාදී වසරකට වැඩි කාලයක් ඉක්මවා තිබුණත් තවදුරටත් නිරවුල් නොවී පවතින අත්තිකාරම් ශේෂ නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| ආයතනය / කාර්යය | ලබාදුන් වර්ෂය | ලබාදුන් මුදල | 2012.12.31 දිනට නිරවුල් නොවී පවතින ශේෂය |
|---|---|---|---|
| | | රු. | රු. |
| උතුරු වසන්තය විශේෂ වැඩසටහන | 2010 | 7,361,259 | 3,967,908 |
| නැගෙනහිර නවෝදය විශේෂ වැඩසටහන | 2011 | 1,733,461 | 5,665 |
| සුළු වාරිමාර්ග පුනරුත්ථාපන වැඩසටහන | 2011 | 30,664,381 | 18,201,252 |
| ඌව පළාත් සභාව - බඩ ඉරිඟු මිලදී ගැනීම | 2010 | 1,916,623 | 1,833,887 |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික වාර්තා සභාගත කිරීම

භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ 2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ලේකම්වරයාගේ අවධානය සඳහා යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ). ණය දීම් සහ ණය අයකරගැනීම්.

(ආ). සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(ඇ). අරමුදල් උපයෝජනය.

(ඈ). අයවැය පාලනය.